778

කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# වැදි ජනතාවගේ සමාජ වෙනස්වීම සමඟ තොරතුරු අවශ්‍යතා වෙනස්වීම පිළිබඳ අධ්‍යයනයකි.

## (දඹාන ආදිවාසි ගම්මානය ඇසුරින්)


| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 778 |
| වර්ග අංකය: | |


B. M. N. J. බස්නායක
FGS/LISC/Mc/08/009

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2011 ජුලි

# සාරංශය

සමාජය නිරන්තරයෙන් වෙනස්වීම්වලට ලක් වන්නකි. සමාජයේ ස්ථාපිත මානව සහ භෞතික සෑම සම්පතක්ම මෙම වෙනස්වීමට සෘජුව හෝ වක්‍රව හසු වෙයි. සමාජ වෙනසත් සමග වෙනස්වීමට ලක් වන ප්‍රමුඛතම සාධකයක් ලෙස තොරතුරු හඳුනාගත හැකිය. සමාජය තුළ වෙසෙන උසස්ම ජීවියා ලෙස සැලකෙන මිනිසාගේ ක්‍රියාකාරකම්වල වෙනස්වීම් සිදු වන්නේ ලබා ගන්නා තොරතුරුවල ස්වරූපයන් අනුවය.

රටක වාසය කරන ස්වදේශිය ජන කොට්ඨාශයන්ට සුවිශේෂී ස්ථානයක් හිමි වෙයි. වෙනස්වන සමාජ ක්‍රමයට හසු නොවී තම අනන්‍යතාව රැක ගනිමින් ජීවත්වීමට ස්වදේශිකයන් උත්සහ කිරීම මෙයට හේතු වී ඇත. සමාජ වෙනසට හසු නොවී කවරෙකුටවත් සිටිය නොහැකි බැවින් මෙකී ස්වදේශිකයන්ද සමාජ වෙනස්වීමට වක්‍ර අයුරින් ලක් වෙයි. මේ අයුරින් ශ්‍රී ලංකා ජන සමාජය දෙස අවධානය යොමු කරන කල්හි වක්‍රව සමාජ වෙනසට ලක් වූ පිරිසක් ලෙස වැදි ජනතාව හඳුනාගත හැකිය. වර්තමානය වන විට මෙම ආදිවාසීන් ස්වදේශිකයින් සහ ශිෂ්ට සමාජය අතර අතරමං වූ පිරිසක් ලෙස හඳුනාගත හැකිය. විවිධ සාධකයන්ගේ බලපෑම් හේතු කොට ගනිමින් ඔවුන්ගේ සමාජය වෙනස්වීමට ලක් වීම මේ සඳහා බලපා ඇත. මේ ආකාරයට වැදි ජනයාගේ සමාජ වෙනස්වීමත් සමග ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතාවන් වෙනස් වූ ආකාරය අධ්‍යයනයට ලක් කිරීම මෙම පර්යේෂණ නිබන්ධනය මගින් සිදු කර ඇත.

දිවයිනේ නොයෙක් ප්‍රදේශවල විසිරී සිටින වැදි ජනතාව අතුරින් දඹාන ආදිවාසි ගම්මානයේ වෙසෙන වැදි ජනතාව ඇසුරු කොට ගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. වැදි ජන සමාජය වෙනස්වීමට ලක් වූ අයුරු හඳුනා ගැනීම, සමාජ වෙනසට සාපේක්ෂව ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතාවල ස්වරූප හඳුනා ගැනීම, තොරතුරු ලබා ගැනීම සඳහා භාවිත කරන සන්නිවේදන ක්‍රම සහ එහිදී ඔවුන් මුහුණපාන ගැටලු මොනවාද? යන අරමුණු මුල් කොට ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. දත්ත දායකයින් 50 දෙනෙකුගෙන් ප්‍රශ්නාවලි වලට පිළිතුරු ලබා ගනිමින්ද, නිරීක්ෂණ සහ සම්මුඛ සාකච්ඡා මගින්ද අවශ්‍ය දත්ත රැස්කර ගන්නා ලදී.

දත්ත විශ්ලේෂණය කිරීමේදී එම දත්ත සියයට ප්‍රතිශතයක් ලෙස වගු සහ ප්‍රස්තාර උපයෝගී කර ගනිමින් ප්‍රදර්ශනය කර තිබේ. මෙලෙස විශ්ලේෂණය කළ දත්ත ඇසුරින් වැදි ජනතාවගේ සමාජය වෙනස්වීමත් සමග තොරතුරුවල අවශ්‍යතාවන්ද වෙනස්වී ඇති බව සහ සරල ජන ජීවිතය සංකීර්ණ වුවා සේම ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතාවන්ගේ ස්වරූපයන්ද සංකීර්ණ වී ඇති බව නිගමනය කළ හැකි විය. තොරතුරු සන්නිවේදනයේදී අවශ්‍ය සන්නිවේදන මාධ්‍යවල හිගකම, විදුලිබලය ගම්මානය පුරාම ව්‍යාප්තව නොමැති වීම,

වැඩිහිටියන්ගේ සාක්ෂරතාව අවම මට්ටමක පැවතීම, තොරතුරු මූලාශ්‍රයන්ගේ හිඟකම වැනි ගැටලු වලට වර්තමානයේදී වැදි ජනයා මුහුණපාන බව නිරීක්ෂණය කළ හැකි විය.

මෙම නිරීක්ෂණවලට විසඳුම් ලෙස විදුලි බලය අනෙක් නිවාස සඳහාද ව්‍යාප්ත කිරීම, විවිධ සංවිධාන මැදිහත් වීමෙන් තොරතුරු මූලාශ්‍ර එකතුව ගොඩ නැංවීම සහ සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා පියවර ගැනීම, තොරතුරු සම්පත් මධ්‍යස්ථානවල එකතුව ගොඩ නැංවීම සහ සේවක පුහුණුව යනාදි වැදි ජනයාගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා විසඳුම් ඉදිරිපත් කිරීම මෙම නිබන්ධනය අවසානයේදී සිදු කර ඇත.